ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව
உள்நாட்டுத் தொழிற்பாட்டுத் திணைக்களம்
DOMESTIC OPERATIONS DEPARTMENT

අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
இல. 30, சனாதிபதி மாவத்தை, கொழும்பு - 01, இலங்கை
No. 30, Janadhipathi Mawatha, Colombo 01, Sri Lanka

චක්‍රලේඛ අංක : 35/03/016/007/004 — 2019 සැප්තැම්බර් 05

**සියලුම සහභාගිත්ව ආයතනවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,**

## විවට වෙළඳ කටයුතු යටතේ වන ස්ථිර පදනම මත වෙන්දේසි

2019 සැප්තැම්බර් 06 දින සිට බලපැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවේ විවට වෙළඳ කටයුතු යටතේ ස්ථිර පදනම මත වෙන්දේසි සඳහා (විකිණීම/මිලට ගැනීම) භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර යන දෙවර්ගයම පිළිගනු ලැබේ.

ඒ අනුව, 2019 සැප්තැම්බර් 06 දින සිට බලපැවැත්වෙන පරිදි 2016 ඔක්තෝබර් 26 වන දින නිකුත් කරන ලද වෙළඳපොළ කටයුතු සඳහා වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ අංක 35/03/016/007/001 හි වගන්ති 83.0, පහත පරිදි සංශෝධනය වේ.

**(අ) භාණ්ඩාගාර බිල්පත් යටතේ වෙන්දේසි නිවේදනය කිරීම**

මහ බැංකුව විසින් ස්ථිර පදනම මත වන වෙන්දේසි පැවැත්වීම නිවේදනය කිරීම එම වෙන්දේසිය පවත්වනු ලබන දිනයේ 09.30 පැය වන විට හෝ ඊට පෙර ව්‍යාපාරික දිනයේදී සිදු කළ යුතුය. එම නිවේදනය, අදාළ වෙන්දේසියේ වර්ගය (ස්ථිර පදනම මත, විකිණීම හෝ මිලට ගැනීම), පිරිනමනු ලබන ප්‍රමාණය (අදාළ සුරැකුම්පතෙහි මුහුණත වටිනාකම), පරිණත වන දිනය, පරිණත වීම සඳහා ඇති දින ගණන, වෙන්දේසි පවත්වනු ලබන දිනය සහ පියවීමේ කටයුතු සිදු වන දිනය යනාදී තොරතුරුවලින් සමන්විත වේ. ස්ථිර පදනම මත සිදු කරන වෙන්දේසිවල පියවීම් කටයුතු වෙන්දේසි පැවැත්වූ දිනට පසු එළඹෙන පළමු ව්‍යාපාරික දිනයේදී සිදු කරනු ලැබේ.

**(ආ) භාණ්ඩාගාර බැඳුම්කර යටතේ වෙන්දේසි නිවේදනය කිරීම**

මහ බැංකුව විසින් ස්ථිර පදනම මත වන වෙන්දේසි පැවැත්වීම නිවේදනය කිරීම එම වෙන්දේසිය පැවැත්වීමට අවම වශයෙන් ව්‍යාපාරික දින 03 කට පෙර ප්‍රකාශයට පත් කරනු ලබයි. අදාළ වෙන්දේසියේ වර්ගය (ස්ථිර පදනම මත, විකිණීම හෝ මිලට ගැනීම), පිරිනමනු ලබන ප්‍රමාණය (අදාළ සුරැකුම්පතෙහි මුහුණත වටිනාකම),පරිණත වන දිනය, පරිණත වීම සඳහා ඇති දින ගණන, වෙන්දේසි පවත්වනු ලබන දිනය සහ පියවීමේ කටයුතු සිදුවන දිනය යනාදී තොරතුරුවලින් මෙම නිවේදනය සමන්විත වේ. ස්ථිර පදනම මත සිදුකරන වෙන්දේසිවල පියවීම් කටයුතු වෙන්දේසි පැවැත්වූ දිනට පසු එළඹෙන පළමු ව්‍යාපාරික දිනයේදී සිදු කරනු ලැබේ.

අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු

011-2477036 | 011-2346287 | ddod@cbsl.lk | www.cbsl.gov.lk